# කොවිඩ් වයිරස් ප්‍රභේදවලට
# නව නාමකරණයක්

**පාලිත වර්ණකුලසූරිය**



විවිධ රටවලින් කොවිඩ් වයිරසයේ නව ප්‍රභේද හඳුනාගනු ලබන බැවින් ඒවා ග්‍රීක හෝඩියේ අක්ෂර අනුපිළිවෙළට යළි නම් කිරීමට තීරණය කළ බව ලෝක සෞඛ්‍ය සංවිධානය නිවේදනය කළේය. කොවිඩ් වයිරස ප්‍රභේද, ඒවා මුල්වරට හඳුනාගත් රටේ නමින් හැඳින්වීම නිසා එම රටවලට ඇති වන අපකීර්තිය වැළැක්වීමත්, වයිරස ප්‍රභේද හැඳින්වීම සරල කිරීමත්, ඒවා හමුවූ අනුපිළිවෙළ නිරූපණය කිරීමත් මෙමඟින් අපේක්ෂා කෙරේ.

ඒ අනුව එක්සත් රාජධානියෙන් මුල්වරට හඳුනාගත් B, 1. 1. 7 කොවිඩ් වයිරස ප්‍රභේදය 'ඇල්ෆා' ලෙසද, දකුණු අප්‍රිකාවෙන් හඳුනාගත් B, 1. 351 ප්‍රභේදය 'බීටා' ලෙසද, බ්‍රසීලයෙන් හඳුනාගත් ප්‍රභේදය 'ගැමා' ලෙසද, ඉන්දියාවෙන් හඳුනාගත් B, 1. 617 ප්‍රභේදය 'ඩෙල්ටා' ලෙසද නම්කර ඇති බව සඳහන්ය. එහෙත් බොහෝ පිරිසක් එම ප්‍රභේදය 'ඉන්දීය ප්‍රභේදය' ලෙස හැඳින්වීම නිසා තමන් අපහසුතාවට පත්වූ බව ඉන්දීය රජය ප්‍රකාශ කර තිබිණි.

නව වයිරස ප්‍රභේදයක් හඳුනාගත් විට එය නම් කිරීමේදී කිසිදු රටක් අපහසුතාවට පත් නොවිය යුතු බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ වසංගතවේද ප්‍රධානී මාරියා වැන් කර්කෝව් පෙන්වාදෙයි.

2021.06.02 මව්බිම පිටු අංක 04